# 1.23 ථාඨ අනුව රාග වර්ගීකරණය කිරීමේ දී මතුවන ගැටලු නිරාකරණය කිරීමට දැනට භාවිත වන ථාඨ 10 ට අමතරව තවත් ථාඨ 22 ක් හඳුන්වා දීම.

රුවින් රංගීත් ඩයස්
109/G/1, සූරියපාළුව, කඩවත.

## ABSTRACT

1620 දී පමණ ව්‍යංකටමඛී පඬිතුමා විසින් ගණිතානුසාරව මේල කරතා 72 ක්, දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතයේ රාග වර්ගීකරණය සඳහා හඳුන්වා දෙන ලදි. ඉන් බොහෝ කලකට පසු 1906 දී පමණ පණ්ඩිත් විෂ්ණු නාරයන් භාත්ඛණ්ඩේ විසින් එම මේල 72 න් හින්දුස්තානී සංගීතයට ගැලපෙන ථාඨ 10 ක් නිර්මාණය කොට ඒ ඒ ථාඨ වලින් බිහිවන ප්‍රධාන රාගයක නමින් එම ථාඨ නම් තැබීය. නමුත් හින්දුස්තානී සංගීතයේදී භාවිත වන චාරුකේෂී, කීර්වාන, අහිර් භෛරව, බසන්ත් මුඛාරී, නට් භෛරව, ආනන්ද භෛරව ආදී බොහෝ රාගවලට සාධාරණයයි පිළිගත හැකි කිසිඳු ථාඨයක් එම රාග 10 තුළ හමු නොවේ. මෙම ගැටලුව දීර්ඝ කලක සිට පැවතුනද එයට නිසි විසඳුමක් මෙතෙක් ඉදිරිපත් වී නැත. එයට විසඳුමක් ලෙස පණ්ඩිත් විෂ්ණු නාරායන් භාත්ඛන්ඩේ විසින් හඳුන්වා දුන් ථාඨ 10 ට අමතරව තවත් ථාඨ 22 ක් යොදා ගතහොත් කිසිඳු අයුරකින් මෙම ගැටලුව පැන නොනගිනු ඇතැයි යන්න මාගේ හැඟීමයි.

මෙම පර්යේෂණ පත්‍රිකාව තුලින් පූර්වෝක්ත ගැටලුව නිරාකරණය සඳහා යෝජිත ථාඨ 22 නිර්මාණය කරගත් ආකාරය දීර්ඝ වශයෙන් පැහැදිලි කිරීමට අපේක්ෂිත අතර ශ්‍රී ලංකාවේ හින්දුස්තානි සංගීතය භාවිතයේදී මතුවන ඉහත ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා මෙම ථාඨ හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ.